## සාමාන්‍ය සමයේ දසඅටවන සතිය
## අඟහරුවාදා

## පළමුවන කියැවීම

ගණන් කතාවෙන් ගත් පාඨයෙකි.

ගණන් කතාව 12: 1-13

"මාගේ සේවක මෝසෙස්ට විරුද්ධව කතා කිරීමට නුඹලා එඩිතර වූයේ කෙසේද?"

මෝසෙස් කුෂ් නම් දේශයෙන් කුෂ් ජාතික ස්ත්‍රියක සරණ පාවා ගත් හෙයින් මීරියම් සහ ආරොන් ඔහුට විරුද්ධව කතා කළහ. "සමිඳාණන් වහන්සේ කතා කළේ මෝසෙස් මගින් පමණක් ද? උන් වහන්සේ අප මගින් පවා කතා නොකරන සේක් දැ"යි ඔව්හු කීවෝය. සමිඳාණන් වහන්සේට එය ඇසිණි. මිහිපිට සිටි සියලු මිනිසුන් අතරෙන් මෝසෙස් අති නිහතමානී කෙනෙක් විය.

සමිඳාණන් වහන්සේ හදිසියෙන් මෝසෙස්ට, ආරොන්ට හා මීරියම්ට කතා කොට, "නුඹලා තිදෙන සම්මුඛ මණ්ඩපයට නික්ම ආ යුතුය"යි වදාළ සේක. ඔව්හු ද එහි ගියහ. උන් වහන්සේ වළා ටැඹකින් බැස අවුත්, සම්මුඛ මණ්ඩපයේ දොරකඩ වැඩ සිට, ආරොන් සහ මීරියම් කැඳවූ සේක. ඔව්හු දෙදෙන පැමිණියහ.

එවිට උන්වහන්සේ කතා කොට, "මා වදනට සවන් දෙන්න. දිවැසිවරු ඔබ අතරේ සිටිත් නම්, සමිඳුන් ඔවුන්ට ප්‍රකාශ වනුයේ දර්ශනවලිනි. ඔවුන්ට කතා කරන්නේ සිහිනවලිනි. මා සේවක මෝසෙස් එසේ නොවේ. ඔහු මා මුළු සෙනඟ මැනවින් දැන හඳුනයි. මම ඔහු සමඟ මූණට මූණ ලා කතා

කරමි. ගුප්ත වදනින් නොව පැහැදිලිව කතා කරමි. ඔහු සමිඳුන්ගේ රූපය දකිනු ඇත. එබැවින් මාගේ සේවක මෝසෙස්ට විරුද්ධව කතා කිරීමට තුඹලා එඩිතර වූයේ කෙසේදැ”යි ඇසූ සේක.

සමිඳාණන් වහන්සේගේ උදහස ඔවුන්ට විරුද්ධව ඇවිළිණි. උන් වහන්සේ නික්ම ගිය සේක. වලාකුළු මණ්ඩපයෙන් ඉවත් විය. පුදුමයකි මිරියම්ට හිම මෙන් සුදු කුෂ්ඨ රෝගයක් වැළඳී තිබිණි. ආරොන් ඈ දෙස බැලූ විට ඇට කුෂ්ඨයක් තිබෙන බව පෙනිණි. එවිට ආරොන් මෝසෙස්ට කතා කොට, අහෝ ස්වාමිනි, අපගේ මෝඩකමින් අප කළ පාපයේ වගකීම අප පිට පවරනු නොමැනවි. ඈ මවු කුසින් බිහිවන, මාංශයෙන් කොටසක් දිරා ගිය, මළ කෙනෙකු මෙන් නොවේවා”යි කීවේය. මෝසෙස් සමිඳාණන් වහන්සේට මොර ගසමින් “මාගේ දෙවිඳුනි, ඈ වහාම සුව කරන ලෙස, මම ඔබගෙන් අයදිමි”යි කියා කෑ ගැසීය.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය                                   51 : 1-5, 10-11

පිළිතුර: සමිඳුනි, අපේ පාපවලින් අප පිවිතුරු කළ මැනව.

ගීය:

දෙවිඳුනි, ඔබේ දයා කරුණාවෙන් මට අනුකම්පා කළ මැනව.
ඔබේ විපුල දයාවෙන් මාගේ අපරාධ මකා දැමුව මැනව.
මාගේ කෙලෙස් මලින් මා මුළුමනින් සෝදාලුව මැනව. මාගේ පාප මලින් මා පිවිතුරු කළ මැනව.

මාගේ අපරාධ මම මැනවින් දනිමි. දිවා රෑ දෙක්හි මාගේ පාප මට සිහි වේ. ඔබට විරුද්ධව, ඔබට පමණක් විරුද්ධව මම පව් කළෙමි. ඔබ හමුයෙහි මම නපුර කළෙමි. එබැවින් ඔබේ තීන්දුව සාධාරණ ය. ඔබේ විනිශ්චය යුක්ති සහගත ය.

පවට නැම්ම ඇතිවයි මා මෙලොව උපන්නේ. කෙලෙස් මලින් යුතුව යි මා මව් කුසේ පිළිසිඳුණේ.
දෙවිඳුනි, මා තුළ නිර්මල සිතක් මවා වදාළ මැනව. තිරසර නව දිවියක් මට දුන මැනව.
ඔබ හමුයෙන් මා පලවා නොහැරිය මැනව. ඔබේ ශුද්ධාත්මය මා කෙරෙන් ඉවත් නොකළ මැනව.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
“ලෝකයේ ආලෝකය මම ය.
මා අනුගාමී වන්නා ජීවනයේ ආලෝකය ලබන්නේ ය”යි
සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

තොහොත්

ආලේලූයා! ආලේලූයා!
“ගුරු දේවයිනි, ඔබවහන්සේ නම්
දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය.
ඔබවහන්සේ නම් ඉශ්රායෙල්හි රජිඳාණෝ ය.”
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 14: 22-36

“වතුර මත ඔබ වෙත එන්නට මට අණ කළ මැනව.”

ජේසුස් වහන්සේ සමූහයා පිටත් කර හරින අතර, ඔරුවට නැඟී තමන්ට පළමුවෙන් එගොඩට යන ලෙස ශ්‍රාවකයන්ට නියම කළ සේක. උන්වහන්සේ ජනකාය යැවූ පසු යාච්ඤා කරන පිණිස වෙන්ව කන්දකට වැඩිය සේක. සවස් වූ කල්හි උන්වහන්සේ තනිව එහි සිටි සේක.

සුළඟ තදින් හැමූ බැවින් ඔරුව එවේලෙහි තරංගවල හැපෙමින්, ගැටෙමින් මුහුද මැද තිබිණි. අළුයම තුනටත් හයටත් අතර උන්වහන්සේ ඔවුන් වෙත මුහුද මතුපිට ඇවිදගෙන වැඩිය සේක. ශ්‍රාවකයෝ උන්වහන්සේ මුහුද මත ඇවිදගෙන වඩිනු දැක කලබල වී "ඒ අවතාරයකැ"යි සිතා, බියෙන් මොර ගැසූහ. එහෙත් ජේසුස් වහන්සේ එකෙණෙහිම ඔවුන්ට කතා කොට, "ධෛර්යවත් වන්න, මේ මම ය. බිය නොවන්නැ"යි වදාළ සේක. පේදුරු උත්තර දෙමින්, "ස්වාමීනි, ඔය ඔබවහන්සේ නම් වතුර මත ඔබ වෙත එන්නට මට අණ කළ මැනවැ"යි කීය. "එන්නැ" යි උන්වහන්සේ වදාළ සේක. එවිට පේදුරු ඔරුවෙන් බැස, ජේසුස් වහන්සේ වෙත වතුර මත ඇවිදගෙන ගියේය. එහෙත් ඔහු මාරුතය වේගවත් බව දැක, බිය වී ගිලෙන්න පටන් ගෙන, "ස්වාමීනි, මා බේරාගත මැනවැ"යි මොර ගැසීය. ජේසුස් වහන්සේ වහාම අත දිගුකොට ඔහු අල්ලා ගෙන "ඔබේ ඇදහිල්ල කෙතරම් හීන ද? සැක කළේ මන්දැ"යි විචාළ සේක. ඔවුන් දෙදෙන ඔරුවට නැගුණු කල සුළඟ නැවතිණි. එවිට ඔරුවේ උන් අය "ඒකාන්තයෙන්ම ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය"ය කියමින් උන්වහන්සේට පසඟ පිහිටුවා වැඳ නමස්කාර කළහ.

ඔව්හු එගොඩ වී ගෙනසෙරෙත් රටට පැමිණියහ. ඒ රටේ මිනිස්සු උන්වහන්සේව ඇඳින, අවට ප්‍රදේශ පුරා පණිවුඩ යවා, සියලු රෝගීන් උන්වහන්සේ වෙත ගෙන්වා, උන්වහන්සේගේ සළුවේ දාවල්ල පමණවත් ස්පර්ශ කරන්නට රෝගීන්ට ඉඩ දෙන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටියහ. එසේ ස්පර්ශ කළ සියල්ලෝම සුවපත් වූහ.

සුවිශේෂ වාක්‍යය එසේය.

(පළමු වසරේදී පෙර දැක්වූ පාඨය මීට පෙර දින කියැවෙන විට අද දින පහත දැක්වෙන පාඨය කියැවිය හැකිය.)

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 15: 1-2, 10-14

"මාගේ ස්වර්ගීය පියාණන් වහන්සේ විසින් රෝපණය නොකරන ලද සියලු පැළැටි උදුරා දමනු ලබන්නේය."

එකල ජෙරුසලමෙන් පරිසිවරු ද විනයධරයෝ ද ජේසුස් වහන්සේ වෙත අවුත්, "ඔබේ ශ්‍රාවකයන් පරම්පරාගත සම්ප්‍රදායයන් කඩ කරන්නේ මන්ද? ඔව්හු වත් පිළිවෙත අනුව අත් නොසෝදා ආහාර අනුභව කරති"යි කීහ.

උන්වහන්සේ සමූහයා කැඳවා ඔවුන්ට කතා කොට, "ඔබ සවන් දී හොඳින් තේරුම් ගන්න. මිනිසා කෙලෙසනු ලැබීමට හේතු වන්නේ කටට ඇතුල් වන දේ නොව, කටින් නික්මෙන දේ ය"යි වදාළ සේක. එවිට ශ්‍රාවකයෝ අවුත් ඔබගේ ඒ කීම අසා, "පරිසිවරුන් තදින් අමනාප වූ බව ඔබවහන්සේ දන්නා සේක් දැ"යි උන්වහන්සේගෙන් ප්‍රශ්න කළහ. උන්වහන්සේ පිළිතුරු දෙමින් "මාගේ ස්වර්ගීය පියාණන් වහන්සේ විසින් රෝපණය නොකරන ලද සියලු පැළැටි උදුරා දමනු ලබන්නේය. පරිසිවරුන්ගෙන් අපට කමක් නැත. ඔව්හු අන්ධයන්ගේ අන්ධ මාර්ගෝපදේශකයෝ ය. අන්ධයෙකු තවත් අන්ධයෙකුට මඟ පෙන්වන්නට ගියොත් දෙදෙනම වළක වැටෙනු ඇතැ"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.